" විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "

# ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
# பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
# OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / தொலைபேசி இலக்கம் / General Telephone 011 - 2093000

SLSI ISO 9001 CERTIFIED
SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01

| මගේ අංකය / எனது இலக்கம் / My No. | CSWP/FIN-PAY/08/FI/15-2024 | ඔබේ අංකය / உமது இலக்கம் / Your No. | | දිනය / திகதி / Date | 2024.12. 19 |
|---|---|---|---|---|---|

ප්‍රාදේශීය ලේකම්,

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,

බුලත්සිංහල.

**<u>ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සංවර්ධන සහකාරවරුන්/නිලධාරීන්</u>**
**<u>සඳහා මුදල් ප්‍රතිපාදන වෙන් කිරීම - 2024 ඇස්තමේන්තුව</u>**

පහත සඳහන් සැපයීම්/සේවාවන් වෙනුවෙන් වියදම් දැරීම සඳහා ප්‍රතිපාදන ඔබ වෙත වෙන් කර දෙනු ලැබේ.

| වැය සම්මතය | විස්තරය | වෙන් කරන ප්‍රතිපාදන මුදල |
|---|---|---|
| | සංවර්ධන සහකාර ඩී.පී. පල්ලෙආරච්චි මිය හට, | |
| 109-03-01-1001 | 2024 වර්ෂයේ වැටුප් හා වේතන ගෙවීම වෙනුවෙන් අමතර ප්‍රතිපාදන ලබා දීම. | රු. 2,670.00 |

02. සියළුම ගෙවීම් වවුචර්වල ඉහත සඳහන් වැය විස්තර නිවැරදිව සටහන් කිරීමට දැඩි ලෙස සැලකිල්ලට යොමු විය යුතු බව පෙන්වා දෙමි.

03. මෙම මුදල් වෙන් කර දීම වියදම් දැරීම සඳහා ප්‍රමාණවත් බලයක් ලෙස සැලකිය යුතු නොවේ. සියලුම වියදම් දැරිය යුත්තේ අදාළ පළාත් සභා මූල්‍ය රීති, ආයතන සංග්‍රහයේ විධි විධාන, ප්‍රසම්පාදන වැඩසටහනේ සඳහන් විධි විධාන සහ රජය සහ පළාත් සභාව විසින් කලින් කලට නිකුත් කරනු ලබන උපදෙස්වලට අනුකූලවයි. මෙහිදී පළාත් මූල්‍ය රීති 93,94,138,324 හා 325යේ විධි විධාන කෙරෙහි මෙහිලා විශේෂ අවධානය යොමු කරවන අතර එකී විධි විධාන දැඩි ලෙස පිළිපැදිය යුතු ය.

04. මෙම මුදල් වෙන් කිරීම එය ප්‍රදානය කළ නිශ්චිත කාර්යයන් වෙනුවෙන් හැර වෙනත් කාර්යයන් සඳහා උපයෝගී කර නොගත යුතු ය. එය වෙනත් දෙපාර්තමේන්තුවකට පැවරීමට ද නොහැක.

05. කිසිම හේතුවක් නිසාවත් මෙම ප්‍රතිපාදන ප්‍රමාණය ඉක්මවා වියදම් නොකළ යුතු බව විශේෂයෙන් සැලකිය යුතු ය. මෙම ප්‍රතිපාදන ඊට කලින් ආපසු පවරා නොගත හොත් දෙසැම්බර් 31 දිනෙන් අහෝසි වන්නේ ය .

06. මෙම මුදල වෙන් කිරීමෙන් දරණ ලද නියම වියදම ගෙවීම් කළ මාසයේම ඔබගේ ගිණුම් සාරාංශය මගින් ප්‍රධාන ලේකම්ට වාර්තා කළ යුතු අතර එයට අමතරව පහත දක්වා ඇති ආකෘතිය ප්‍රකාරව හර නිවේදනයක් මගින් මාසය අවසානයේ පහත සඳහන් විද්‍යුත් ලිපිනයට මා වෙත වාර්තා කළ යුතු ය. එසේ හර නිවේදනයක් එවීම වෙන් කළ මුදලින් දරන්නා වූ ගෙවීම් සම්බන්ධයෙන් ප්‍රධාන ලේකම් වෙත ඉදිරිපත් කරනු ලබන ගිණුම් වාර්තාවලට වැඩිමනක් වශයෙන් බව කාරුණිකව දන්වමි.

විද්‍යුත් ලිපිනය : csfpayment@wpc.gov.lk

එස්.ඩබ්ලිව්. ගුණවර්ධන,
ගණකාධිකාරී (මූල්‍ය),
ප්‍රධාන ලේකම්,
පළාත් මුදල් අමාත්‍යාංශ ලේකම් හා
පළාත් භාණ්ඩාගාර ලේකම් වෙනුවට,
බස්නාහිර පළාත.

S.W. Goonawardena
Accountant (Finance)
Office of the Chief Secretary (W.P.)
Western Provincial Council Office Complex
204, Denzil Kobbekaduwa Mawatha,
Battaramulla

පිටපත් :-
01) නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්)
02) ගණකාධිකාරී (පොත් තැබීම)

ප්‍රධාන ලේකම් (බ.ප.),

**........................................ මස හර නිවේදනය.**

අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/කාර්යාලය :- ........................................................

| | වැය සම්මතය | ලබා ගෙන ඇති ප්‍රතිපාදන මුදල රු. | මාසය තුළ වියදම රු. | මාසය අවසානයට මුළු වියදම රු. | ඉතිරි ප්‍රතිපාදන මුදල රු. |
|---|---|---|---|---|---|
| 01. | ...................... | ...................... | ...................... | ...................... | ...................... |
| 02. | ...................... | ...................... | ...................... | ...................... | ...................... |
| 03. | ...................... | ...................... | ...................... | ...................... | ...................... |

දිනය :- ...........................

......................
ආයතන ප්‍රධානී